"අපට මේ උපකාරය කරන්න ඔයා තවමත් පමා නැහැ... එයා චිත්‍ර අඳින්න උත්සාහ කරන්නෙ එයා දැන් ඉන්න මානසික තත්වය නිසාම නෙමෙයි. ඉස්සර ඉඳලම එයා ඒකට ආසයි. එයා ආර්ටිස් තමයි කරලා තියෙන්නෙත්. වැඩිදුර ඉගෙන ගන්න ඕන කිව්වම අපිත් හිතුවා දැන් තියෙන තත්වයත් එක්ක ඒක වඩාත් හොඳයි කියලා." නිමන්ත වාඩි වී සිටි බංකුවෙන් නැගී සිටින අතර කීවේ ය. "..අමන්දි මරණය දිහා බලාගෙන ඉන්නවා... අපි මේ ගමන ආවෙ අමන්දිගෙ හිතට සහනයක් ලැබෙයි කියල හිතාගෙන.. මේ පරිසරය අමන්දිගෙ හිතට සහනයක් වුණත් ආයෙ ලංකාවට ගියාම..? මං හරිම අවුල් වෙලා ඉන්නෙ විශ්වනාත්.."

විශ්වනාත් නිමන්ත ගේ උරහිස් මත සිය දෑතම තැබුවේ ය.

"හිත වට්ටාගන්න එපා.. අප විශ්වාසයෙන් ජීවිතේට මුහුණ දෙමු... මං උදව් කරන්නම්" ඔහු කීවේ ය.

000000

තමාගේ ඇඳුම් අතර තිබූ සුන්දරම ඇඳුමින් සැරසුණ අමන්දි සාලයට ආවා ය. නදී පැමිණ සිටි අමුත්තන් ඇයට හඳුන්වා දුන්නා ය.

"අමන්දි.." ඒ කටහඬ ඇයට හොඳින් පුරුදු ය. ඈ හිස හරවා බැලුවා ය. ලෙන්ගතු සිනාවකින් මුව සරසා ගත් ඒ අගන්තුකයා දෙස ඇය බැලුවේ විශ්මයෙනි.

"මිස්ටර් විශ්වජිත්..? ඔයා මෙහෙ..?" ඇයට කියැවිණි.
"ඔව් අමන්දි.. මං ආවා.." ඔහු පහත් හඬින් කීවේ ය. අවසන් වරට එහු වූ දිනයේ ඔහුගේ දෑස් තුළ රැඳී තිබූ දැඩි බැල්ම අතුරුදන්ව තිබෙනු අමන්දිට පෙනුණි. ඔහු ඇය අසළටම පැමිණ සිට ගත්තේ ය. ඔහුගේ සිරුරින් නික්මුණ විලවුන් සුවඳ පවා ඇයට දැනුණි.

".. මට ඔයාට කියන්න වැදගත් දෙයක් තියෙනවා.." ඔහු කීවේ ය. අමන්දි විමතියෙන් අසා සිටියා ය. සිය කලාගාරයේ දී අකරුණාවන්ත ලෙස තමා පන්නාගත් මේ මිනිසාගේ කට හඬෙහි එදා තිබූ රළු බවට කුමක් වීද?

"..එදා ඔයාගෙ හිත රිදුනා නම් මට සමාවෙන්න අමන්දි.. මගෙ අතින් වුණේ වරදක්.. මං ඒ ගැන හුඟක් පසුතැවුණා.. ඔයා ගියාට පස්සෙ.." ඔහු කීවේ ය.

"ඒ ගැන පසුතැවෙන්න දෙයක් නැහැ.. මං ඉල්ලීමක් කළා.. ඔයා ඒක ප්‍රතික්ෂෙප කළා.. එච්චරයි.. ඔයාට එහෙම කරන්න අයිතියක් තියෙනවා.. මං ඒක ගැන අමනාපයක් නැහැ.. මං ඉල්ලීමක් කළ පමණින් කෙනෙක් ඒකට එකඟ වෙන්න ඕනෙක කියල මං කවදාවත් බලාපොරොත්තු වෙන්නෙ නැහැ.. විශේෂයෙන් නන්නාඳුනනා කෙනෙ-ක්.." ඈ කිවේ ඔහු ඉදිරියෙන් ඉවත් වන්නට සැරසෙමිනි. ඔහු ඉතා සීරුවෙන් ඇගේ ගමන් මඟ හරස් වන සේ සිටගත්තේ ය. ඈ හිස ඔසවා බැලුවා ය. ඔහු සිනාසෙමින් සිටිනු ඇයට පෙනුණි.

".නැහැ කිව්වට ඔයා තරහින් කතා කරන්නෙ.. තරහ ගන්න එපා.. මට සමාවෙන්න.. ඔයා ලංකාවට ගියාම අපි පන්තිය පටන් ගමු.. " ඔහු කීවේ ය. ඈ අවඥාවෙන් සිනාසුණා ය.

"ඇයි හදිසියෙම අදහස වෙනස් කර ගත්තෙ..? මට බලහත්කාරයෙන් ඔයාගෙ ශිෂ්‍යාවක් වෙන්න ඕනෙ නැහැ.. අනික ඔයා හොයා ගෙන තිබුණනෙ මං උන්හිටි ගමන් සිත්‍ර අඳික්ක ආසා වෙලා ඔයා පස්සෙ ආව සල්ලිකාර අම්ඹණ්ඩිකෙනෙක් කියලත්.. " ඈ ඇණුම් පදයක් කිවා ය. ඔහු රිදවන්නට ඇයට අවශ්‍යව තිබුණි. ඔහු ඉතා බැරෑරුම් බැල්මක් තමා වෙත යොමා සිටින බව ඇය දුටුවේ හිස ඔසවා ඔහු දෙස බලන විට ය.

"තාමත් තරහින් නේද ඉන්නෙ..? මං කිව්වෙනෙ.. තරහ ගන්න එපා.. මං සමාව ඉල්ලුවනේ.. අපි ලංකාවට ගිය ගමන් පන්තිය පටන් ගමු.." ඔහු මඳක් කල්පනා කරමින් සිටියේ ය. "..නැහැ... එයිට කලින් මම කැමතියි ඔයා එක්ක මුම්මාත් යන්න.. අපේ පන්තිය එතනින් පටන්ගමු.. මට ඕනෙ චිත්‍ර ශිල්පය කියනා භාවනාවේ බටහිර ස්වරූපය ඔයාට පෙන්වන්න.. චිත්‍ර ශිල්පියෙක් වෙන්න හිතාගෙන ඉන්න හැම දෙනාටම ඒක වටිනා පාඩමක් වන බව මට විශ්වාසයි.. ඒක ලංකාවෙදි කවදාවත්ම ලබාගන්න බැරි පාඩමක්" ඔහු කිවේ ය. ඔහු ගේ කටහඬෙහි රැඳුණ උද්යෝගය ඇය සතුටට පත්කළේ ය. ".. මම හෙට උදේ දහයට එනවා.. ලෑස්ති වෙලා ඉන්න.."

"මට බැහැ.." ඈ මුරණ්ඩු ලෙස කීවා ය.
".. මම හෙට උදේ දහයට එනවා.. ලෑස්ති වෙලා ඉන්න.." ඔහු ඇගේ මුරණ්ඩු වදන් නෑසුණා සේ නැවත කීවේ ය.

ඒ රාත්‍රිය අපූරු එකක් යැයි අමන්දිට සිතුණි. ඈ කලකට පසුව බො-හෝ සතුටින් සිටියා ය. මහත් අභිරුචියකින් ආහාර ගත්තා ය. සිනාසුණා ය. අමුත්තන් හා සුහදව කතා බහ කළා ය. ඒ මුලු කාලය තුළ ම විශ්වනාත් විමසුම් බැල්මක් දල්වාගත් ඇසින් යුතුව තමා දෙස බලා සිටි බවද ඇය දුටුවා ය.

"ජීවිතේ අපි හිතනවට වඩා සුන්දරයි අමන්දි.. ඒක සමහර විට අපට අහුවෙන්නෙ නෑ.. හොයා ගන්න වෙනවා.." පිටව යන්නට සැරසුණ මොහොතේ ඔහු ඇගේ දෑතම අල්ලාගෙන කීවේ ය.

රාත්‍රියේ උනුසුම් පොරෝනාව තුළට ගුලි අමන්දි වී ඉතා සුව පහසු නින්දක් නිදා ගත්තා ය. හෙට එළැඹෙන නව දිනය වෙනුවෙ-න් සිහිනයක් දකිමින් උදෑසන වන තුරු එක දිගට නිදා ගත්තා ය.







000000000000

පොරොන්දු වූ ආකාරයට ම විශ්වජිත් උදෑසන දහයට පැමිණියේ ය. ඒ වන විට අමන්දි උදේ ආහාරය ගෙන සූදානම්ව සිටියා ය. ඒ වන විටත් නිමන්ත සිටියේ ඇඳේ ය. අමන්දි හා විශ්වජිත් සමඟ මුම්මාත් නොයන්නට ඔහු තීරණය කරගෙන සිටියේ ය. මේ ඇගේ සිහිනයක් මල් එල ගැන්වෙන දවස ය. ඒ දවසට බාධාවක් නොවන ලෙස සිටින්නට ඔහුට අවශ්‍ය විය.

නිමන්ත තමා සමඟ එනවා දැයි අමන්දි නොඇසුවා ය. ඔහු ඒ ගමනට කිසිදු උනන්දුවක් නොදක්වන බව ඇය නිරීක්ෂණය කළා ය. ඔහුගෙන් ඒ පිළිබඳව හාරා අවුස්සා අසන්නට ඈ නොසිතුවා ය. එසේ සිතුණෝ මන්දැයි ඇය නොදත්තා ය. නිමන්තට නොකියා ම ඈ නිවසින් පිට වූවා ය.

"නගින්න.." විශ්වජිත් කුලී රියේ පසුපස දොර ඇර අමන්දි නගින තෙක් බලා සිටියේ ය. අමන්දි ගොඩ වූ පසු ඔහු ඇය අසලින්ම වාඩි වූයේ ය. ඇය තිගැස්සුණ බව විශ්වජිත් දුටුවේ ය. "මේ ලංකාව නෙවෙයි.." ඔහු කීවේ එනිසා ය.

ඈ පිළිතුරක් ලෙස කිසිවක් නොකීවා ය. මුම්මාත් වලට එනතෙක් ම ඔවුහු නිහඬතාව රැකගත් හ.

**මතු සම්බන්ධයි**




